මගේ අංකය :- SG/Admin/CS /8/මැතිවරණ,
ආයතන අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2020.06.23 දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මැ.සි.ආ.) / සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් / මිනින්දෝරු අධිකාරීවරුන්,
සහකාර අධ්‍යක්ෂ (පාලන),
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී, කාර්මික හා පරිපාලන නිලධාරීන්,
පරිපාලන නිලධාරී (වැ.බ.),

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020</u>**
**<u>අමාත්‍යාංශ වල මාධ්‍ය ඒකක විසින් රාජ්‍ය දේපල භාවිතා කරමින් පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරඟ කරනු ලබන පක්ෂ හා අපේක්ෂකයන් වෙත ප්‍රචාරණය ලබා දීමෙන් වැළකීමේ අවශ්‍යතාවය</u>**

උක්ත කරුණ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභා සභාපතිගේ අංක : EC/EDR/2020/4 හා 2020.05.31 දිනැති ලිපිය හා බැඳේ. (අදාළ ලිපියෙහි පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම ලිපියෙහි සඳහන් කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලෙසටත් ඔබ යටතේ සිටින අදාළ නිලධාරීන් එම කරුණු පිළිබඳව දැනුවත් කර ඒ අනුව කටයුතු කරන ලෙසටත් කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්.ටී.පී. හේරත්

එච්.එම්.ටී.පී.හේරත්,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් වෙනුවට.

தேர்தல்கள் ஆணைக்குழு

සාමාන්‍ය කාර්යාලය : 011-2868441, 2868442, 286844
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/2020/4<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2020.05.31<br>திகதி |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

ප්‍රමුඛ අවධානය සඳහා

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020**

**අමාත්‍යාංශවල මාධ්‍ය ඒකක විසින් රාජ්‍ය දේපල භාවිතා කරමින් පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරඟ කරනු ලබන පක්ෂ සහ අපේක්ෂකයින් වෙත ප්‍රචාරණය ලබා දීමෙන් වැළැක්වීමේ අවශ්‍යතාවය**

අමාත්‍යාංශ මාධ්‍ය ඒකක විසින් හෝ අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වලට අයත් කැමරා උපකරණ ඇතුළු රාජ්‍ය දේපල භාවිතා කරමින් එකී මාධ්‍ය ඒකක වල රාජ්‍ය නිලධාරීන් හෝ වෙනත් පුද්ගලයන් පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරඟ කරනු ලබන පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය සහ වැඩසටහන් වල නිරත වන බවට පැමිණිලි මැතිවරණ කොමිෂන් සභා වෙත ලැබී ඇත.

02. 2020.03.02 දින පාර්ලිමේන්තුව සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා වූ නිවේදනය ප්‍රකාශයට පත් කර ඇති බැවින් කිසිදු මැතිවරණ නීතියක් උල්ලංඝනය කිරීමේ හැකියාවක් ඡන්ද කාල සීමාව තුළදී සිදු විය නොහැක. තවද, මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කර ඇති 2020.03.06 දිනැති "ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් හෝ ඒවල දේපල පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට හැකියාවක් ඇතිවන ලෙස හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන" ගැසට් පත්‍රයේ 2.2 වන වගන්තිය යටතේ රාජ්‍ය ආයතන/ මණ්ඩල/ අධිකාරීන් සතු රාජ්‍ය දේපල මැතිවරණය තුළ භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව සඳහන් කර ඇත.

03. ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමු කර ඔබ ආයතනයන්හි මාධ්‍ය ඒකකයට අනුයුක්ත කර ඇති නිලධාරීන් සහ එම කාර්යයේ යෙදවීමට කැමරා උපකරණ හා අනෙකුත් රාජ්‍ය දේපල කිසිදු දේශපාලන ප්‍රචාරණ කටයුත්තකට නොයෙදවන බවට තහවුරු වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වන අතර මෙවැනි ක්‍රියා සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා වශයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි වගකීම ඔබ විසින් දැරිය යුතු බවද සැලකිම යොමකි.

04. එමෙන්ම කිසිදු රාජ්‍ය ආයතනයකින් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනයට හේතුවිය හැකි ප්‍රචාරක හෝ වෙනත් මාධ්‍ය දැන්වීම් රාජ්‍ය අරමුදල් භාවිතා කර පළකිරීමෙන් වැළකී සිටිය යුතු බවට මීට පෙර ඡන්ද විමසීම් වලදී පනවා ඇති නියමය මේ අවස්ථාවේදී වලංගු හෙයින් එය අනුකූලව ක්‍රියා කළ යුතු බව වැඩි දුරටත් සැලකිල්ලට ගෙන සිටීම. මේ බව ඔබගේ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන වෙත දැනුවත් කිරීමට ක්‍රියා කරනු මැනවි.

මහින්ද දේශප්‍රිය
සභාපති/ මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.)

පිටපත : 1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
3. මැතිවරණ කොමසාරිස් ජනරාල්/ ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව
4. සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්
5. පොලිස්පති/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ)
6. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)/ සියලුම නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්